**ශීර්ෂය 317 - උතුරු මැද පළාත් සභාව - 2022**

---

01. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

1.1 දැක්ම

පිරිපුන් පළාතක්

1.2 මෙහෙවර

ධරණීය සමමිතික සන සාර්ව සංවර්ධන ප්‍රවේශයකින් පළාත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ජාතික සංවර්ධනයට සෘජු හා අඛණ්ඩ ලෙස දායකවීම.

1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

02. මූල්‍ය ප්‍රකාශන

මුළු ප්‍රතිපාදන හා වියදම

2022 වර්ෂයේදී උතුරු මැද පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රුපියල් 25,157,000,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රුපියල් 22,101,695,000 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පළාත් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරි කර තිබුණු මුදල රුපියල් 3,055,305,000 ක් වූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 12 ක් විය.

| **වියදම** | **2022 දෙසැම්බර් 31 දිනට** | | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 22,601,000,000 | 20,356,795,000 | 2,244,205,000 | 10 |
| මූලධන | 2,556,000,000 | 1,744,900,000 | 811,100,000 | 32 |
| | 25,157,000,000 | 22,101,695,000 | 3,055,305,000 | 12 |

03. විගණන නිරීක්ෂණ

317 ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයක් සිදුකර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳව විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.